



**පන්නිපිටිය මීසම**

# විවාහ මංගල්‍ය පූජාවන් සඳහා උපදෙස් පත්‍රිකාව

**(1)** විවාහ වන දෙදෙනාගෙන් කතෝලික පාර්ශවයේ එක් අයෙක් හෝ පන්නිපිටිය මීසමට අයත් නොවන්නේ නම් අයත් වන මීසමේ මීසම් භාර පියතුමාගෙන් ලිපියක් රැගෙන එන්න.

**(2)** **විවාහ අපේක්ෂක සමුළුව.**
ආශිර්වාදකාර බන්ධනයට පෙර ඔබ විවාහය සඳහා සූදානම් වීමේ සති අන්ත පන්තියට සහභාගී විය යුතුයි. ඒ සඳහා ඔබ මීසම්භාර පියතුමාගෙන් අවශ්‍ය අයදුම් පත්‍ර ලබා ගන්න. ඔබට ලබා දෙන අයදුම්පතේ සඳහන් දුරකථන අංකයට කතා කොට ඔබට පහසු මධ්‍යස්ථානයක් වෙන් කර ගෙන එයට සහභාගී වෙන්න.

**(3)** **ආශිර්වාදකාර බන්ධනයට පෙර විභාගය.**
ආශිර්වාදකාර බන්ධනයට පෙර විභාගය සඳහා ඔබ මීසම්භාර පියතුමාගෙන් කල් වේලා ඇතිව දිනයක් වෙන් කරගෙන අදාළ ලේඛන සම්පූර්ණ කරන්න. එයට පෙර විවාහය සඳහා සහතික කරන ලද ප්‍රසාද ස්නාපන සහතිකයක් ලබා ගන්න.

**(4)** **රෝස පැහැති කොළය.**
ඔබ විවාහය සිදු කිරීමට නියමිත දිනට මාස 3 ක් ඇතුලත ඔබේ කොට්ඨාශයේ විවාහ රෙජිස්ට්‍රාර් හමු වී රෝස පාට කොළ ලබා ගන්න. ඔබ දෙදෙනා විවාහ කොට්ඨාශ දෙකකට අයත් නම් වෙන් වෙන්ව කොළ දෙකක් ලබා ගන්න. ඔබේ විවාහය සිදු වන්නේ දේවස්ථානයේ බවත්, ඔබ පැමිණියේ රෝස පාට කොළය ලබා ගන්නට බවත්, විවාහ රෙජිස්ට්‍රාර්ට පැහැදිලිව පවසන්න.

**(5)** **දේවස්ථාන කටයුතු**

1) මනාල යුවල සඳහා දණ පුටුව, අල්තාරය ඇතුළත හෝ අල්තාරයෙන් පිටත, ඉදිරිපිට ඔබේ කැමැත්ත අනුව සකස් කළ හැක. ඔබේ කැමැත්ත කල්වේලා ඇතිව සන්ක්‍රිස්තියන් පෝෂියා මහත්මියට දැනුම් දෙන්න.
2) ගායනා කණ්ඩායම - ගායනා කණ්ඩායම සපයා ගැනීමේ වගකීම ඔබ සතුය. ඔබ පිටතින් ගායනා කණ්ඩායමක් රැගෙන එන්නේ නම් ඒ සමඟ ඕගනය ද රැගෙන ආ යුතුය. එසේ පිටතින් නොගෙනෙන්නේ නම් ශිරාණි මනතුංග මහත්මිය (077 3672791) අමතා ගායනා කණ්ඩායම සම්බන්ධ කර ගත හැක.
3) මල් සැරසිලි - මල් සැරසිලි ඔබට කැමති කෙනෙක් මාර්ගයෙන් කර ගත හැක. අවශ්‍ය නම් ඒ සඳහා කෙනෙක් ඔබට දේවස්ථානයෙන් හඳුන්වා දිය හැක. (ශිරෝමි මහත්මිය - 071 8815714)
4) දේවස්ථානයට ගෙවිය යුතු මුදල
විවාහ ලියාපදිංචි ගාස්තුව ඇතුළුව අනෙකුත් කටයුතු සඳහා දේවස්ථානයට ගෙවිය යුතු මුදල,
මිසමේ අය සඳහා රු. ........................... මීසමට අයත් නොවන අය සඳහා රු. ...........................

**(6)** ඔබගේ විවාහයට අදාළ ලියවිලි විවාහයට සති දෙකකටවත් පෙර සම්පූර්ණ කර මීසම් කාර්යාලයට භාර දෙන්න. මීසමේ කාර්යාල දිනය සිකුරාදා වන අතර සිකුරාදා දිනයක පමණක් ඒ සඳහා පැමිණෙන්න. කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් මීසම් කාර්යාල ලේකම් ෂර්ලි සිල්වා මහත්මිය (077 7639061) අමතන්න.

**(7)** විවාහ මංගල දිව්‍ය පූජාව සඳහා පෙරහුරුවක් කිරීම සුදුසුය. ඒ සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කර ගැනීම සඳහා මීසම් කාර්යාල ලේකම් ෂර්ලි සිල්වා මහත්මිය (077 7639061) අමතන්න.

**(8)** විවාහ මංගල දිව්‍ය පූජාවෙන් පසු සංග්‍රහ කටයුතු කරන්නේ නම් ඒ සඳහා මීසම් භාර පියතුමාගේ අවසරය ලබාගෙන ඔබට ලබා දෙන උපදෙස් පත්‍රිකාව අනුව කටයුතු කරන්න.

**- මීසම් භාර පියතුමා -**